# පාලි අට්ඨකථා තුළින් හෙළිවන වාණිජ තොරතුරු සුඟක්

වයි.කේ.තිස්ස බණ්ඩාර

ලංකාවේ පාලි සාහිත්‍යය ප්‍රමාණයෙන් ද වැදගත්කමින් ද ඉතිහාසඥයාට මෙන් ම ජනව්‍යවහාරය ඉගෙනගන්නා ශිෂ්‍යයාට ද වාග් විද්‍යාඥයාට මෙන් ම සමයාන්තර ගවේෂකයාට ද එකසේ අගනේ ය. ප්‍රෘථුල ලෙස සලකා බලන කල එය ප්‍රධාන ශීර්ෂ තුනක් යටතේ වර්ග කළ හැකි ය. ඉන් පළමු වැන්න බුද්ධ ධර්මය අන්තර්ගත ත්‍රිපිටක පාලිය යි. දෙවැන්න බුද්ධඝෝෂ හිමියන්ගේ ද ඔහුගේ සමකාලීනයන් හා පශ්චාත් කාලීනයන්ගේ ද අට්ඨකථා ය. ත්‍රිපිටකයට කරන ලද විවරණ ග්‍රන්ථයන්වන මේ අට්ඨකථාවන් පංචම ක්‍රිස්තු ශතාබ්දයේ දී සංගෘහිත බව එහි වර්තමාන ස්වරූපයෙන් පෙනී යතත් නිසැක වශයෙන් ම පුරාණතර ම ලේඛනයන් ප්‍රතිෂ්ඨා කොටගත් බව ස්ඵුටකළ හැකි ය. තුන්වැනි කොටසෙහිලා ගිණිය හැක්කේ පංචම ශත වර්ෂයේ පටන් මේ දක්වා කාලය තුළ නොයෙක් අන්‍යය ලෞකික විෂයයන් ද අළලා රචනා කරන ලද ග්‍රන්ථ ය.[1]

ලක්දිව අට්ඨකථා සම්බන්ධයෙන් ඒ වායේ පෙළ, අටුවාව, ආචාර්‍යවරු ගැන දීර්ඝ විස්තරයක් ආචාර්‍ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් මහතා සපයා තිබේ. අට්ඨකථා වැඩි ප්‍රමාණයක් ලියනු ලැබූ බුද්ධඝෝෂ හිමි පිළිබඳව ඔහු මෙසේ හඳුන්වයි. "අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුද්ධඝෝෂ හිමියන් බව මේ ලේඛනයෙන් පෙනී යයි. එතුමා බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරින් ශ්‍රේෂ්ඨතමයා යයි අවිවාදයෙන් පිළිගත හැකි ය. ඒ හේතුවෙන් ඔහුගේ ජීවන චරිතය වටා ගෙතුනු ජනප්‍රවාද රාශියක් ද වේ. එතුමා මෙලොව පහළවූයේ බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාලි අටුවා ලිවීම පිණිස ය යන ජනප්‍රවාදයක් පවා මෙරට පවතී"[2] යනුයි.

පාලි අට්ඨකථාවල නොයෙක් අතින් වැදගත් තොරතුරු ඇත. වචනයක් හෝ සූත්‍රයක් විස්තර කිරීමේ දී එය වටා ඇති සියලු විස්තර ඉදිරිපත් කරයි. වචනාර්ථය, නිරුක්තිය, ව්‍යාකරණ ලක්ෂණ, මතභේද වෙතොත් ඒවා, නිදර්ශන කතා, අතිරේක විස්තර එයට අයත් ය. බුද්ධකාලයේ සිට ක්‍රි.ව. පළමුවැනි සියවස දක්වා ඓතිහාසික, සාමාජික, සාමයික, දේශපාලන තොරතුරු අට්ඨකථාවල තැන්පත් වී ඇත. සමහරවිට පෙළේ එන අදහස්වල වැඩියාමක් අටුවාවල දී දැක්ක



හැකි යි. නිදසුනක් වශයෙන් පෙළපොත්වල බුදුන්වහන්සේ ආගමික වශයෙන් උත්තරීතර මනුෂ්‍යයෙකි. අටුවාවල දී බුදුන්වහන්සේ ආශ්චර්‍ය අද්භූතජනක අසාමාන්‍ය දෙවියෙකි. පටිච්ච සමුප්පාදය ගැන නව අදහස් දක්නට ලැබේ. ඓතිහාසික හා ආගමික වශයෙන් අට්ඨකථාවල විශේෂ වැදගත්කමක් ඇත. මෙ කළ තිබෙන පාලි අටුවාවලින් වැඩි ගණනක් ලියන ලද්දේ බුද්ධඝෝෂාචාර්යන් විසිනි.[4]

ඉතිහාසය, පුරාවිද්‍යාව, සමාජ විද්‍යාව, බෞද්ධ සංස්කෘතිය සහ තවත් විෂයයන් උදෙසා පාලි අට්ඨකථාවල මූලාශ්‍රමය වැදගත්කමක් තිබේ. බුද්ධකාලීන සමාජයේ සහ ඇතැම්විට අටුවා ලියවුනු සමයන්ට අදාළ ව බහු විෂයමය තොරතුරු පාලි අට්ඨකථා තුළ අන්තර්ගත වේ. ඒවායින් වාණිජ ක්ෂේත්‍රයට අදාළ ව තොරතුරු ස්වල්පයක හැඳින්වීමක් මෙම ලිපියෙන් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ. පාලි අට්ඨකථා අතුරින් හේවාවිතාරණ මුද්‍රණයේ කෘති මූලික වශයෙන් පදනම් කර ගනිමින් අතිරේක වශයෙන් තව ද සුළු ප්‍රමාණයක මූලාශ්‍ර ඇසුරින් මෙය ඉදිරිපත් කැරේ.

**බෝධි සත්ව චරිත සමය.**

එ කල අප බෝසතාණන්වහන්සේ සාර්ථවාහන වෙළඳ කුලයෙහි ඉපිද ක්‍රමයෙන් තරුණවිය පැමිණි පසු ගැල් පන්සියයක් රැගෙන වෙළඳමෙහි හැසිරුණාහ. ඔහු වරින් වර සතර දිසාවට ම ගියේ ය. මේ අතර එක්තරා මඳ නුවණැති තවත් වෙළඳ පුත්‍රයෙක් හමුවිය. ඔහු ද ගැල් පන්සියයක් සමඟින් වෙළඳමේ හැසිරෙන අයෙකි. මෙහි දී බෝසතාණෝ කල්පනා කරන්නේ මඳ නුවණැති වෙළඳ පුත්‍රයාගේ සහ මාගේ යන දෙදෙනාගේ ම ගැල් දහස සඳහා මාර්ගෝපකරණය ද ගොනුන් සඳහා තණකොළ ද ප්‍රමාණවත් නොවන බව යි. ඒ නිසා එක් අයෙකු පෙරාතුව යා යුතු බව සුදුසු යැ යි නුවණ මඳ වෙළඳ පුත්‍රයාට පැවසී ය.[5]

මෙයින් කල්ප පහකට පෙරාතුව අප මහා බෝසතාණෝ සේරිව නම් රටෙහි කච්ඡපුට මාදිලියේ ලෝහ වෙළෙන්දෙකු සමඟ නීලවාහිනී නම් ගඟින් එතර අන්ධපුර නම් නගරයට පිවිස වීථි බෙදගෙන වෙළඳමෙහි යෙදුණි. මේ අතරේ එකී නගරයේ පෙර ඉසුරුමත්ව සිට පසුව දිළිඳු බවට පත් වූ එකී නගරයේ සිටු නිවසක මිත්තනියක හා මිණිපිරියක බැලමෙහෙවරින් ජීවිකාව කළා ය. ඒ නිවස

අසළින් ගමන් කළ කුඨ වෙළෙන්දගේ හඬ ඇසී වළලු වෙළෙන්දෙකු බව දැන එම දැරියට වළලු ගැනීමේ ආශාවක් ඇති වූවා ය. ඇය මිත්තනියට මේ බව පවසා මුදල් නැතිකමින් නිවසේ ඇති තලියක් කුඨවෙළෙන්දට පෙන්වා එයට වළලු දෙන මෙන් අයැද සිටියා ය. එම තලිය සූරාබලා එය රන්තලියක් බව දැන දැනත් කුඨ වෙළෙන්ද දැරිය රවටා කිසිවක් වටින්නේ නැති බව පවසා පිටව ගියේ ය. අනතුරුව බෝසත් වෙළෙන්ද ද එහි පැමිණි විට පෙරකී දැරිය පැරණි තලිය පෙන්වා වළලු දෙනමෙන් ඉල්ලා සිටියා ය. බෝසත් වෙළඳ තුමා මෙය අගනා රන් තලියක් බව පවසා ඇයට ඔහු සතු සියළු වස්තුව වූ කහවණු පන්සියයක් වටිනා භාණ්ඩ ද කහවණු පන්සියයක මුදල් ද දී එකී රන්තලිය මිලට ගත්තේ ය. නැවත තමාදුන් රන්කහවණු පන්සියයෙන් කහවණු අටක් ඉල්වාගෙන එම කහවණු අට නැවියාට දී ගඟ තරණය කළේ ය. පසුව පැමිණි කුඨ වෙළෙඳ තැන වූ සියල්ල දැන ගඟ තරණය කරන බෝසතාණන් දෙස බලා ශෝකයෙන් බරිතව ළය පැලී ක්‍රෝධයෙන් මළේ ය.[6]

පෙර සමයෙක අප බෝසත්තුමාණෝ සාර්ථවාහන කුලයෙහි ඉපිද වැඩිවියට පැමිණි පසු ගැල් පන්සියයක් සමඟ වෙළඳ මගට පිවිසියහ. හෙතෙම යම් දිනක සැට යොදුන් වූ මහා වාලුකා කාන්තාරයට පිවිසියේ ය. ගැල්කරුවන් සමඟ කාන්තාරයට බට ඔහු දිවා කාලයේ දී ගැල් නවතා ආහාර පිස කා බී රාත්‍රී කාලයේ දී ගමන සුදුසු බව තීරණය කළේ ය. මේ සඳහා පෙර ගමන්කරුවෙකු ද නියමකරමින් තරු සංඥා ආශ්‍රයෙන් ගැල් පැදවූයේ ය. ගැල් පැද වූ නියාමක තැන සුව පහසු අසුනක හිඳ දිසාවන් පෙන්වමින් සිටිනාතුර දී ඔහුට නින්ද ගියේ ය. සංඥා නොලත් පෙර ගමන් ගැල පසුපස පැමිණි සියලු ම ගැල් උදෑසනවනවිට පෙර සිටි තැනට ම පැමිණ ඇති බව දැන ගත්තේ ය.[7]

පෙර කසී රාජ්‍යයෙහි බාරාණසී නම් නුවර බ්‍රහ්ම දත්ත නම් රජකරණ සමයෙහි අප බෝසත්තුමා රජුගේ තක්සේරුකරුව සිටියේ ය. රන් රිදී මැණික් ආදියෙන් ඇත්, අස්, ගව මහිෂාදීන්ගේ මිල ගණන් දක්වන්නේ මොහු ය. මේ තක්සේරුකරුගේ කටයුතු පිළිබඳව සෑහීමකට පත්නොවූ රජු ලෝභ සිතින් යුක්තව වෙනත් අයෙකු මේ තනතුර සඳහා පත් කිරීමට ඉටා ගත්තේ ය. රජු ඉහළ සිට රජ මිදුල බලනවිට සාමාන්‍ය තත්ත්වයේ එක්තරා මිනිසකු මිදුල මැදින් ගමන් කරන බව දුටුවේය. මේ නුගත් පුරුෂයා මාගේ තක්සේරුකරු ලෙස



පත්කරමි යි සිතා ඒ බව ඔහුට කීවේ ය. පසුව එකී කටයුතු නොදන්නා තක්සේරුකරුගේ කටයුතු අනුව වැඩි යමක් ඉපයී ය. මේ සමයෙහි උත්තරාපථයෙන් පැමිණි අස්ව වෙළෙන්දෙකුගේ අසුන් පන්සියයක් සඳහා මේ නූගත් තක්සේරුකරු මිල නියමකර ඇත්තේ එක් සහල් නැළියකි.[8]

පෙර බරණැස් නුවර මහ රජුගේ අනුශාසක තනතුරෙහි බෝසතාණන්වහන්සේ කටයුතු කළහ. රජු සාමාන්‍යයෙන් තරමක් වස්තුව සඳහා ලෝභියෙකි. රජුට සැඩ චණ්ඩ අශ්වයෙකු ද සිටී. ඔහු මහාසෝණ නම් විය. මෙ සමයෙහි උත්තරාපථ මාර්ගයෙන් අසුන් පන්සියයක් වෙළෙන්දෝ වෙළඳම් පිණිස මෙහි පැමිණියහ. බෝධිසත්වයන්ගේ කාර්‍ය්‍ය අසුන්ගේ මිල නියම කිරීමයි. තක්සේරුකරු නිසි මිල නියම කර අසුන් මිල දී ගැනීමේ දී විශාල ධනයක් වැයවන බව රජුට ඒත්තු ගියේ ය. රජු බෝසත්තුමා තක්සේරුකමින් නිදහස් කොට වෙනත් කුඨ අයකුගෙන් මේ කාර්‍ය්‍ය සපුරා ගන්නට කටයුතු කළේ ය. ඒ සමඟ රජු මොහුට පවසන්නේ තමාගේ චණ්ඩ මහාසෝණ අසු වෙළඳමට ගෙනා අසුන් අතරට යවා හැපීමට ලක්කර තුවාල සිදු වූ අබලන් අසුන්ට අඩු මිලක් නියම කොට අසුන් මිලදී ගන්නා ලෙසයි.[9]

**ගොඩබිම් වෙළඳම.**

අප බුදුන්වහන්සේ දවස අනේපිඬු සිටුහුගේ නො දුටු මිත්‍ර පසල්දනවි සිටුවරයෙක් විසී ය. හෙතෙම පසල් දනව්වලින් නිපැයෙන භාණ්ඩ ගැල් පන්සියයක් පුරවා සේවකයන් සමඟ සැවැත්නුවරට එවී ය. මේ වස්තු අපගේ මිත්‍ර අනේපිඬු සිටුවරයාගේ අනුදැනුම මත විකුණා ලැබෙන මුදලින් වෙනත් භාණ්ඩ ගෙනේවා යැයි දන්වා සිටියේ ය. අනේපිඬුසිටු ද ඒ සේවකයන් හොඳින් පිළිගෙන පහසුකම් සපයා භාණ්ඩ විකුණා වෙනත් භාණ්ඩ දුන්නේ ය.[10]

එ සමයෙහි ම ජේතවනාරාමය අසල පණ්ණික නම් උපාසක වෙළෙන්දෙකු විවිධ වර්ගයේ මුල් , පළාකොළ, ලබු , පුහුල් විකුණා ජීවත් විය. ඔහුට පැහැබර රූපස්වභාවයෙන් යුත් ලැජ්ජාය ඇති ආචාරශීල දියණියක සිටියා ය.[11]

පණ්ඩිත වෙළෙඳ තැන කිසියම් ක්‍රමයකින් ආරවුල් නොමැතිව භාණ්ඩ බෙදගෙන පසුව සුවඳ දුම් මල් ආදිය රැගෙන බුදුන්වහන්සේට වදිනු පිණිස වෙහෙරට ගියේ ය. එහි දී බුදුන්වහන්සේ පණ්ඩිත



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

වෙළෙන්දගෙන් ආගිය විස්තර විමසා වදළහ. සියලු තතු උන්වහන්සේට පණ්ඩිත වෙළෙන්ද විසින් දක්වන ලදි. බුදුන්වහන්සේගෙන් අද පමණක් නොව ඔබට පෙර සමයෙක ද ඔහු කුට වාණිජව සිටියේයැයි වදරමින් මෙ බඳුම අතීත කථාවක් වදළහ.[12]

එක්තරා වෙළෙන්දෙකු උක් සකුරු ආදිය ගැලක පටවාගෙන පසල් දනව්වකට පැමිණ විසකණ්ඨක ගනිව්, විසකණ්ඨක ගනිව් කියා හඬ නැගී ය. මෙය ඇසූ ගැමියෝ විසවනාහි මාරාන්තිකය ගෙල ද විස වී මැරෙති යි කියා එතැනින් දරුවන් ද රැගෙන පලාගියහ. පසුව වෙළෙන්ද අති මධුර ගනිවු, අති රසැතිදේ ගනිවු මේ උක් සකුරු බොහෝ වටී යනුවෙන් කීවේ ය. මේ ඇසූ බොහෝ මිනිස්සු මුදල් දී උක් සකුරු ගත්හ.[13]

එකල්හි රජගහ නුවර උපන් භාණ්ඩ බොහෝ වටී. රජගහ නුවර වැසි සිටුවරයෙක් ඒවා ගැල් පන්සියයකින් රැගෙන සැවැත් නුවරට ගොස් විකුණා ලාභ ලැබී ය. අනේපිඬු සිටු ද එලෙසම වෙළදම් කළේ ය.[14]

එ සමයෙහි අංග මගධ දෙරටෙහි සාර්ථවාහන වෙළෙඳුන් විකිණිය යුතු බොහෝ භාණ්ඩ ගැල්හි පුරවාගෙන සින්ධු දේශයටත් සෝවීර දේශයටත් ගියහ. එයින් අතිරේක ලාභ බොහෝ ලැබීය.[15]

එක් සමයෙක අංකුර නැමැත්තෙකු ගැල් පන්සියයක් ද තවත් බ්‍රාහ්මණයෙකු ගැල් පන්සියයක් ද බැගින් ගැල් දහසකින් භාණ්ඩ රැගෙන වෙළදමේ යද්දී මංමුලාවී මරුකතරට පිවිස ජලය හා තණ නොමැති බැවින් මහත් අසීරුතාවයට පත්වූහ.[16]

සේතව්‍ය නුවර වැසි චූලකාල, මඣ්ජිමකාල හා මහාකාල යන තුන් සොයුරෝ එකතුව වෙළෙදමෙහි යෙදුනාහ. මින් දෙදෙනෙකු භාණ්ඩ ගෙනෙති. මද්දුමයා ගෙනා භාණ්ඩ විකුණයි. දිනක් එම සොයුරෝ දෙදෙනා ගැල් පන්සියයකින් භාණ්ඩ රැගෙන ගියහ. ඒ අතර සැවැත් නුවර ජේතවනාරාමය ආශ්‍රිත ගැල් මුදා ලී ය. අනතුරුව මහාකාල තෙම මල් ගඳවිලවුන් රැගෙන බුදු පුදට ගියේ ය. බාලයා ආරක්ෂාවට නතර විය. පසුව මහාකාල බණ අසා පැවිදි විය. මේ වග දැනගත් චූලකාල තෙමේ ද පැවිදි විය.[17]

එක්තරා වෙළෙන්දෙක් ගැල් පන්සියයක් පුරවාගෙන වෙළදමේ යන්නට පෙරාතුව භික්ෂූන්වහන්සේ පන්සියයක් වෙත ගමනට ආරාධනා කළේ ය. උන්වහන්සේලාට දන් පැන් දීමට ඔහු සූදනම් විය.



මෙම වෙළෙන්දගේ ගමන පිළිබඳව කලින් දැනගත් මං පහරණ සොරු පන්සියයක් ඔහු එන මග බලමින් සිටියහ.[18]

**සාගර වෙළදම.**

සමුද්‍ර වෙළදමෙහි යෙදුනු එක්තරා වෙළෙන්දෙකු නැව් නගින දිනයේ දී භික්ෂූන්වහන්සේට දන් දී සිල්හි පිහිටියේ ය. ඒ පුවත සැකවින් මෙසේ ය. "එකල බොහෝ සමුද්‍ර වෙළෙඳුන් පිරිසක් (හත්සියයක්) නැව් නැගී වෙළදමෙහි ගියහ. අතර මග දී නැව සිදුරු වී යාත්‍රාව තුළට ජලය පැමිණ යාත්‍රාව ගිලෙන්නට පටන් ගත්තේ ය. එවිට බොහෝ වෙළදුන් තම තමන්ගේ දෙවියෝ සිහිකර යදිමින් භ්‍රාන්තව සිටියහ. එක් අයෙකු පමණක් නිහඬව නිර්භයව සිටියේ ය. අන් අය ඔහුගෙන් ඒ කිම දැ යි විමසූහ. එ විට ඔහු තමන්කළ පුන්‍ය කටයුත්ත (භික්ෂූන්වහන්සේට දන්දීම) කියා සිටියේ ය. ඒ නිසා තමන්ට භයවන්නට කාරියක් නැති බව ඔහු තවදුරටත් පවසා සිටියේ ය.[19]

පෙර සමයෙක බිඳුණු නැව් වලින් තම්බපණ්ණියට පැමිණි පන්සියයක වෙළෙඳ සමූහයක් එක්තරා යකින්නකගේ මායාවට හසුවූහ.[20]

එක්තරා වෙළෙන්දෙකු දිසාකාකයකු රැගෙන නැවෙන් බාවේරු රටට ගියේ ය. එම රටෙහි පක්ෂීන් නොමැති හෙයින් එහි මිනිසුන් එම කාකයාගේ හැඩරුව වර්ණනාකරමින් ඔවුන්ට දෙන ලෙස ඉල්ලී ය. කාකයාගේ අයිතිකරු එයට අකමැති විය. එහෙත් මුදල් දෙන්නට කැමති විය. ඒ අනුව කහවණු පහේ සිට කහවණු සියය දක්වා මිල කළේ ය. කහවණු සියයකට එකී කාකයා එහි වැසියෝ මිලට ගත්හ. පසුව රන් කූඩුවක තබා රස බොජුන් දෙමින් ඔහු පෝෂණය කළහ. කලකට පසුව බෝසත් මොණරා සමඟ බාවොරුවට එම වෙළඳ පිරිස ගියහ. වෙළෙන්දන්ට අවනතව සිටි මොණර තෙමේ අසුරු ගසන සැනින් හඬලන්නටත් අත්පොලසන් දෙනවිට නටන්නටත් පුරුදුව සිටියේ ය. මේ රැඟුම නිසා බාවොරු වැසියෝ නැව දෙසට එකතු විය. නැවෙහි ඉදිරිගේ සිට පිල්විදහා නටන මොණරා දැක්මෙන් සතුටට පත්වූහ. ඔහුද මිලට ගන්නට රට වැසියෝ කැමති වූහ. ක්‍රම ක්‍රමයෙන් කහවණු දහස දක්වා මිල නියම වූයෙන් එකී මුදලට මොණරා මිලට ගත්හ. පසුව එම වැසියෝ මොණරා සත්රුවනින් සැදි කූඩුවක තබා මස් මාංශ, රස ආහාර, පලතුරු ආදියෙන් පෝෂණය කළහ. මොණරාට

ලැබුණු තරම් අහර හෝ සත්කාර කාකයාට නොලැබිණ. කාකයා කෙරෙහි මිනිසුන් එතරම් උනන්දු නුවූයෙන් ආහාර නොමැතිව කාකයා කාන්තාරයට පියාසර කළේ ය.[21]

එක්තරා වෙළඳ පිරිසක් භාරුකච්ඡයේ සිට ස්වණ්ණභූමිය වෙත වෙළදමෙහි ගියහ.[22]

ගෞතම බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා වෙළඳුන් පන්සියයක් උන්වහන්සේට මහදන් පිළිගන්වා නිරුපද්‍රිතව නැවත පැමිණිවිටක බුදු පුදට එන බව පැවසූහ. බොහෝ දුර ගොස් මෙම ගැල් පන්සියය මහා කාන්තාරයකට පිවිසුණාහ. එහි ජලය හා අහර නොමැතිව මංමුලාවූහ. මොවුහු එම කාන්තාරයේ නාගයන් අධිගෘහිත නුග ගසක් දැක එහි ජලය ඇති බව සිතුවෝය. ඒ අනුව එක් අයෙක් ගසට නැග පෙර දිගින් අත්තක් කපා හෙලීය. එයින් තල් කඳක් ප්‍රමාණ ජල ධාරාවක් නික්මිණ. එයින් ජලස්නානය කොට ජල පානය කළහ. තවකෙක් දක්ෂිණ දිසාවෙන් අත්තක් කපා හෙලීය. ඉන් නොයෙක් ආකාරයේ රසයෙන් යුත් භෝජන නිකුත් විය. ඒවා අහරට ගත්හ. අනතුරුව පැසුලු දිගින් අත්තක් කැපීය. ඉන් අලංකාර ස්ත්‍රීන් පැමිණුනාහ. ඒ ස්ත්‍රීන් සමඟ මොවුහු අභිරමණය කළෝ ය. අවසන උතුරු දිගින් අත්තක් කපා හෙලී ය. එයින් නානා මාදිලියේ සත් රුවන් පහළ විය. ඒවා ගැල් පන්සියයක පුරවාගෙන නැවත සැවැත් නුවරට ම පැමිණියෝ ය. දෙවන දින බුදුන්වහන්සේට මහදන් දී එයින් ලබන පින් රුක් දෙවියන්ට පුදමු යැ යි කීහ.[23]

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ රජකම් කරන සමයෙහි එක්තරා වෙළෙඳුන් පන්සියයක් නැවෙන් මුහුදට පැමිණ සතියක් ඇවෑමෙන් පරතෙර නොපෙනෙන මුහුද මැද දී නැව භංගුරත්වයට පත්විය. එක් වෙළෙන්දකු පමණක් ඉන් ඉතිරි විය. සෙස්සන් කැස්බෑවන් හා මසුන් විසින් කන ලද්දෝ ය. ඉතිරි වූ තැනැත්තා ගොඩ බිමට පැමිණ නිර්වස්ත්‍රව තොටුපල වෙත පැමිණියේ ය. එහි වැස්සෝ මොහු දැක ශ්‍රමණයෙකු යැයි සිතා කෙතරම් අල්පේච්ඡ අයෙක් දැ යි සතුටට පත්වූහ. මිනිසුන් දුන් වස්ත්‍ර ද ඔහු ප්‍රතික්ෂේප කළේ ය. මෙය දුටු පටුනු වැස්සෝ මොහු උතුම් අල්පේච්ඡ අයෙක්යැයි කීහ. ඔහුට අරමක් ද (ආවාසයක්) කරවා දුනි. මහා ලාභ සත්කාර ලබමින් ඔහු කදම්බිය අචේලක යැයි ප්‍රසිද්ධ විය.[24]



සැවැත් නුවර සියයක් පමණ වෙළඳුන් පිරිසක් සුවණ්ණ භූමියට යෑම සඳහා නැව් නැගී සයුරට පළිපන්නහ. මෙම නැව වාතවේගයෙන් ඔබ මොබ කැරකී ගියේ ය.[25]

සුප්පාරක පටුනේ සිට සැවැත් නුවරට දුර යොදුන් එකසිය විස්සක් වන්නේ ය.[26]

සැවැත් නුවර වැසි වූ ද පාටලී පුත්ත නගරවාසි වූ ද බොහෝ වෙළෙඳුන් නැව් නැගී සුවණ්ණ භූමියට ගියහ. අතර මග දී යාත්‍රාවක් අක්‍රිය විය. එයට හේතු විමසා බැලීමේ දී එම නැවෙහි කාලකණ්නියෙකු සිටින බව අනුමාන වශයෙන් සලකා බලා කාලකණ්නි සලාක පත්‍රය විමසා බැලී ය. ඉන් එහි සිටි කාලකණ්නි පුද්ගලයා හඳුනා ගත්හ. අනතුරුව ඔහු අතිරේක පහුරක් බැඳ එහි නංවා මුහුදට දමාපියා නැව ගමන් ඇරඹුවේ ය.[27]

ඇතැම් විටෙක දී මුහුදින් එතෙර ද, වැලි කතරෙහි ද, වේවැල් බැඳ යා යුතු මාර්ගවල ද, කණු සිටුවා යා යුතු මාර්ගවල ද, පර්වත, නදී ආදී දුෂ්කර ගමනින් ධන ආශාවෙන් වෙළදමේ ගියහ.[28]

වාණිජ කර්මාන්ත ලෙස නො කළ යුතු කර්මාන්ත කීපයකි. සත්ථවණිජ්ජා, සත්තවණිජ්ජා,මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, යනුයි.[29]

වංචනික ලෙස මිල ගණන් නියම කිරීම, අගය අඩුකොට තැකීම, අල්ලස් ලබා ගැනීම, සොර තරාදි පඩි මගින් කිරුම් මිනුම් කරයි ද ඒ අපායගාමී වන්නට හේතු වේ.[30]

බරණැස් නුවර වැසියෙක් එසමයෙහි ඇතුන් මරා දත්, නිය, සණ මස් ආදිය විකුණා ජීවිකාව කළේ ය.[31]

එමෙන් ම එසමයෙහි හොර මුදල් ක්‍රමයක් ද භාවිතව ඇත. ඒවා කූඨ කහාපණ ලෙස කියැවෙයි.[32]

**නොකළ යුතු වෙළදම.**

වාණිජ කර්මාන්ත ලෙස නො කළ යුතු කර්මාන්ත කීපයකි. සත්ථවණිජ්ජා, සත්තවණිජ්ජා,මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, යනු යි.[33]

නොකළ යුතු වෙළදම් සයක් ද ඇත්තේ ය. සත්ථවණිජ්ජා, ආවුධ භණ්ඩං කාරෙත්වා තස්ස වික්කයො, මනුස්ස වික්කයො, මංස වණිජ්ජා, විසවණිජ්ජා යනාදිය යි.[34]

වෙළඳ ද්‍රව්‍ය.

පෙර සමයෙක එක්තරා දුගී කුල පුත්‍රයකු වීථියක මැරී සිටි මීයකුගේ මළ කුණක් ගෙන ගොස් වෙළඳ සලක සිටි බළලකු සඳහා වික්කේ ය. ඉන් ඔහු ලත් මිල කාකනිකයක් වටනේ ය. එම සුලු මුදලෙන් පැණිරස සහ පැන් ලබා ගත්තේ ය. අනතුරුව මල්කරුවන් සඳහා එකී පැණිරස හා පැන් ස්වල්ප ස්වල්ප බැගින් දුන්නේ ය. මල්කරුවෝ ද එකිනෙකා එක බැගින් මල්මිටි ඔහුට දුන්නේ ය. ඒ මල්වලින් ලත් මුදලින් පසුදින පෙර දිනට වඩා පැණිරස හා පැන් මිල දී ගත්තේ ය. අනතුරුව ඔහු ඒවා රැගෙන මල් නෙලන තැනට ම ගියේ ය. එ දින මල් කරුවෝ තමන් ප්‍රමාණයක් නෙලාගත් මල් පඳුරුවල ඉතිරිය ඔහුට දී ගියෝ ය. ක්‍රම ක්‍රමයෙන් කහවණු ඉපයූ ඔහු මසක් තුළ මහා ධනවතෙක් විය. අවසානයේ දී එකී නගරයේ සිටුවරයාගේ දියණිය ද විවාහකර ගත්තේ ය. තදනන්තරව බිරියගේ පියාගේ අභාවයෙන් පසු ඔහු සිටු තනතුරට පත්විය.[35]

**ඒ සමයෙහි ම ජේතවනාරාමය අසල පණ්ණික නම් උපාසක වෙළෙන්දෙකු** විවිධ වර්ගයේ මුල් , පළාකොළ, ලබු , පුහුල් විකුණා ජීවත් විය. ඔහුටම පැහැබර රූපස්වභාවයෙන් යුත් ලැජ්ජාය ඇති ආචාරශීල දියණියක සිටියා ය.[36]

පෙර බරණැස් නුවර මසුරු සිටාන කෙනෙක් සුරා සලකින් මස්සක් දී සුරා ලබාගෙන ගඟ ඉවුරක ලැහැබක් තුළට වී රහසින් සුරාපානය කළේ ය.[37]

අප බුදුරජාණන්වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසන සමයෙහි එක්තරා සුරා වෙළෙන්දෙක් අමුරන් හා රන් ගෙන සුරා වෙළදම් කළේ ය. දිනක් ඔහු තම අතවැසියාට වෙළඳ කටයුතු භාර දී ජලස්නානය සඳහා ගියේ ය. එවිට එම අතවැසි තැන ලුණු සකුරු ආදිය වරින් වර කමින් සුරා බොන ජනයා දැක සුරාවට ලුණු නැතැයි සිතා සුරා හැලියට ලුණු නැලියක් පමණ බහාලුවේ ය. සුරා බොන උදවිය එහි ලුණු ඇති බව දැන මුවින් බැහැර කළෝ ය. එයට හේතු ඇසීමේ දී අතවැසි තැන සිද්ධිය කියා සිටියේ ය. එවිට සුරා පානය කරන්නවුන් එම්බා මෝඩය තා මෙබඳු මිහිරි පානයක් නැති කළේයැ'යි කියා බැනවැදී නැගිට ගියහ.[38]

පෙර බරණැස් නුවර මහ රජුගේ අනුශාසක තනතුරෙහි බෝසතාණන්වහන්සේ කටයුතු කළහ. රජු සාමාන්‍යයෙන් තරමක් වස්තුව සඳහා ලෝභියෙකි. රජුට සැඩ චණ්ඩ අශ්වයෙකු ද සිටී. ඔහු මහාසෝණ නම් විය. මෙ සමයෙහි උත්තරාපථ මාර්ගයෙන් අසුන් පන්සියයක් වෙළෙන්දෝ වෙළඳම් පිණිස මෙහි පැමිණියහ. බෝධිසත්වයන්ගේ කාර්ය අසුන්ගේ මිල නියම කිරීමයි වන්නක තක්සේරුකරු නිසි මිල නියම කර අසුන් මිලදී ගැනීමේ දී විශාල ධනයක් වැයවන බව රජුට ඒත්තු ගියේය. රජු බෝසත්තුමා තක්සේරුකමින් නිදහස් කොට වෙනත් කුඨ ආයකුගෙන් මේ කාර්ය සපුරා ගන්නට කටයුතු කළේය. ඒ සමඟ රජු මොහුට පවසන්නේ තමාගේ චණ්ඩ මහාසෝණ අසු වෙළඳමට ගෙනා අසුන් අතරට යවා හැපීමට ලක්කර තුවාල සිදු වූ අබලන් අසුන් අඩුමිලක් නියම කොට අසුන් මිලදී ගන්නා ලෙසයි.[39]

බරණැස් නුවර වැසියෙක් එසමයෙහි ඇතුන් මරා දත්, නිය, සණ මස් ආදිය විකුණා ජීවිකාව කළේ ය.[40]

තම මව විසින් දෙන ලද මුදල් රැගෙන එක්තරා දැරියක තෙල්ගෙන ඒමට යම්කිසි වෙළඳ සලකට ගියාය.[41]

පදුමුත්තර බුදුන්වහන්සේ දවස එක්තරා කුල දසියක තමාගේ කෙස් වැටිය විකුණාලත් මුදලින් සුජාත නම් තෙරුන්වහන්සේට දන් දුන්නාය.[42]

අප බුදුන්වහන්සේ දවස එක්තරා කාන්තාවක තලතෙල් හා සුරා වෙළදම් කළාය.[43]

එමෙන්ම එසමයෙහි හොර මුදල් ක්‍රමයක් ද භාවිතව ඇත. ඒවා කුඨ කහාපණ ලෙස[44] හැඳින්විණි.

කහවණුවලට මුවන් විකුණූ පුවතක් මෙසේය. එක්තරා මුව වැද්දෙක් මුවකු හා මුව පැටියකු රැගෙන යන අතර දී තවත් අයෙක් මිල කීය දැයි ඇසීය. එහිදී මුවා කහවණු දෙකකි. මුව පෝතකයා එක් කහවණුවකි යයි වැද්ද පිළිතුරු දුන්නේය. එවිට එක් කහවණුවක් දී එකී පුද්ගලයා මුව ගෝතකයා රැගෙන ගියේය. මඳ දුරක් ගොස් ආපසු පැමිණි ඔහු මුව පෝතකයාගෙන් වැඩක් නැත මුවා දෙවයි කිය. එවිට කහවණු දෙකක් දෙවයි වැද්ද කීවේය. මිලදී ගත් තැනැත්තා මෙසේ කීවේය. මම මුලින් කහවණුවක් දුනිමි. එය සැබවියයි වැද්ද කීවේය. එසේනම් මේ මුව පෝතකයා ද ගනුව ඔහුද කහවණුවක් වටී. තවද කහවණුවක් මේ පෝතකයා සමඟ ගනුව එවිට කහවණු දෙකක් වන්නේය. එසේ ගෙන මුවා දෙවයි කීය. වැද්ද කාරණය වටහාගෙන මුව පෝතකයා සහ තව කහවණුවක් ලබාගෙන මුවා දුන්නේය.[45]



0 ... ST 2015

**විනිමය මාධ්‍ය : කහවණු.**

පෙර දවස විශාලා මහනුවර එක්තරා වෙළෙඳ (ආපන) ශාලාවක් ඉදිරිපිට මඩ ගොහුරු වලක් විය. බොහෝ ජනයා එහි පැත වෙහෙසුනාහ.[46]

එකල වාණිජ ක්ෂේත්‍රයේ විනිමය මාධ්‍යය හැටියට භාවිතව ඇත්තේ කහවණු සහ තවත් මුදල් විශේෂයන් ය. පාලි සාහිත්‍යය තුළ 'කහවණු ' යන්න කහාපණ වශයෙන් සඳහන් වේ.[47]

ඉන් නිදසුන් කීපයක් ඉදිරියේ සඳහන් කෙරෙන පරිදි වේ. " එකල්හී වජ්ජිපුත්තක භික්ෂූහු ඒ පොහෝදිනයෙහි රන්තලියක ජලය පුරවා සංඝයා මැද තබා උපාසකයන්ට මෙසේ කියත්... ඇවැත්නි සංඝයාට කහවණුවක් හෝ කහවණු පාදයක් හෝ රන් මස්සක් හෝ දෙවු... (**කහාපණම්පි, අඩ්ඪම්පි, පාදයම්පි, මාසකරූපියම්පි**)[48]

කහවණු සම්බන්ධයෙන් දැක්වෙන විස්තර අතරේ විවිධ කාර්‍යයන් සඳහා කහවණු ගෙවා ඇති අයුරු දක්නා ලැබේ. මේ ඒ ආකාර කාර්‍යයන් කීපයකි. උත්තරා සිටු කුමරියගේ ස්වාමියාගේ කිසියම් හේතුවක් නිසා ඇයට විවාහවීමෙන් අනතුරුව පින් දහම් කරන්නට අවස්ථාවක් නැති බව ඇයගේ දෙමාපියෝ දැනගත්හ. මෙයට පිළියම් ලෙස විස්තර ලියූ ලිපියක් ද කහවණු පහළොස් දහසක් ද ඇයට යැවිණ. එහි සඳහන් පරිදි එකී කහවණු පහලොස්දහස සිරිමානම් ගණිකාවට දී ඇයගේ ස්වාමිපුරුෂයා සිරිමා වෙත පාවාදිණ. මේ දින පහළොවක් සඳහා ය. සිරිමා ගණිකාව සමඟ ඇගේ පුරුෂයා සිටින කල්හි ඇය පින් දහම් කළාය.[49]

කහවණු ද ඇතුලත් මිල මුදල් සම්බන්ධයෙන් බුදුන්වහන්සේ භික්ෂූන්වහන්සේ වෙනුවෙන් තහනමක් පනවා වදළහ. එහි වටපිටාව මෙසේ ය. බුදුරජාණන්වහන්සේ රජගහනුවර වේලුවන කලන්දකනිවාප නම් වූ වේළුවනයෙහි වසන සේක. එකල උපනන්ද තෙරුන් නිතර නිතර කුලුපග නිවසක් වෙත බත් පිණිස යයි. ඒ නිවසේ අනුභව කළයුතු දෙයක් වෙයිනම් ඒ තෙරුන්ට දීම සිරිතකි. දිනක් මස් වර්ගයක් එම නිවසට ලැබිණ. ඉන් කොටසක් උපනන්ද ආයුෂ්මත්වහන්සේට තැබිණ. ඒ නිවැසි දරුවෙකු උදෑසන මස් දෙවයි කියා හැඬුවේ ය. දරුවා හඬන හෙයින් උපනන්දහිමිට වෙන්කළ මස් කොටස දරුවාට දෙවපි යි ගෙහි පියා බිරිඳට කීවේ ය. වෙනත් මසක් ගෙන ආයුෂ්මතුන්ට



දෙමුයැයි කතිකාකොට එකී මස් කොටස දරුවාට දුන්නේ ය. උපනන්ද තෙරුන් නිවසට පැමිණි විට මේ පුවත කියා සිටියේ ය. අනතුරුව උන්වහන්සේ වෙනුවෙන් නිවෙස් හිමියා කියනුයේ කහවණුවකින් ඔබට කුමක් ගෙනායුතු දැයි යනු යි. (**කහාපණෙන භන්තෙ කිං ආහරියතු** ) එවිට එම තෙරුන්වහන්සේ ... ඇවැත කහවණුව මට පරිත්‍යාග කරන ලදදැයි ඇසී ය. (**පරිච්චත්තො මෙ ආවුසො කහාපණොති**) අනතුරුව, ඇවැත ඒ කහවණුව ම දෙව යි කීහ. (**තඤ්ඤෙව මෙ ආවුසො කහාපණං දෙහිති**) මේ කහවණුව දුන්පසු ගෙහිමියා එම භික්ෂූවට අවමන් කියා නුගුණු පතුරුවයි අපි යම්සේ රන් රිදී මසු කහවණු පිළිගන්මෝ ද එමෙන් ම මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ද රන් රිදී මසු කහවණු පිළිගනිතියි කීය. (**යථෙව මයං රූපියං පටිග්ගණ්හාම, එවමෙම ඉමෙ සමණා සක්‍යපුත්තියා රූපියං පටිග්ගණ්හන්ති**) මෙම පුවත බුදුන්වහන්සේට ආරංචි විය. එහි දී උන්වහන්සේ, යම් මහණෙක් රන් රිදී මසු කහවණු තෙමේ ගණී නම් හෝ අනුන ලවා ගන්නවා නම් හෝ ලඟතබන ලද්දක් ඉවසා නම් හෝ නිසඟි පචිති වේ යැයි වදළහ (**යො පන භික්ඛු ජාතරූප රජතං උග්ගණ්හෙය්‍යවා උග්ගණ්හාපෙය්‍යවා උපනික්ඛිත්තං වා සදියෙය්‍ය, නිසග්ගියං පාචිත්තියන්ති**)[50] කහවණු ගැන පෙළපොතේ ප්‍රථම සඳහන එය යි. තවදුරටත් විස්තර දැක්වීමේ දී " **ජාතරූපං නාම සත්ථුවණ්ණො වුච්චති**" ජාතරූප නම් රන් යැයි කියනු ලැබේ.[51] **රජතං නාම කහාපණො ලොහමාසකො, දරුමාසකො, ජතුමාසකො යෙවොහාරං ගච්ඡන්ති** (රජත නම් කහවණුය, ලොහොමසුය, දැවමසුය, ලහමසුය, යමෙක් ව්‍යවහාරයට යේ නම් ඒ යැ)[52] බුදුන්වහන්සේ "කහවණු" යන වචනය භාවිත කර නැත. අදළ තන්හිදී දක්වා ඇත්තේ ජාතරූප රජතං යන්නයි. විස්තර කිරීම්වල දී අර්ථවල කහවණු යන්න යෙදී ඇත. බුදුන්වහන්සේ විමසා වදරනුයේ මෙසේ ය. **සච්චංකිරත්වං උපනන්ද රූපියං පටිග්ගහෙසිති** ? යනුවෙනි. 'රූපියං' යන්න වැදගත් වේ. එය කාලයාගේ ඇවෑමේ දී ඉන්දියාවේ බහුල ව්‍යවහාරයට පැමිණ 'රුපියල' වී ද යනු විමසනු වටී. පසුව යටත් විජිත සමයෙන් අනතුරුව ඉංග්‍රීසි ජාතිකයෝ ඉන්දියාවේ දී එය රුපීස් යන්නට පරිවර්තනය කළෝ ද ? ඉන් පසුව ලංකාවේ 'රුපියල් ' යන්න මුදල් සඳහා 1815න් පසුව භාවිතා විණි ද ? විමසුව මැනවි.

කහවණුවක ප්‍රමාණය හෝ බර නිශ්චිත වශයෙන් අවබෝධ කොටගත නොහැකි ය. එහෙත් එය කිසියම් වස්තුවක් කැබලි කැබලි කොට කපා ගනිමින් සකසා ගත් යමක් විය යුතු ය. ඒබ ව

අනුමාන කිරීමට අටුවා චාරීන්වහන්සේලාගේ මේ සඳහන නිදසුන් කරමු. එනම්, **කහපණකන්ති** යනු සියලු ශරීරය තියුනු වැයකින් කැබලි කැබලි කොට කහවණුවක ප්‍රමාණයට කැපීම යි. (***කහපණකනති සකල සරීරං තිනනාහි වාසිහි කොට්ිතො පට්ඨාය කහාපණ මතතං පාතෙනෙතා කොටෙට්නති)***[53]

බුදුන්වහන්සේ දවස ජේතවනාරාමය අසළ ආරාමයක් ඉදිකිරීමට තීර්ථකයෝ පිරිසක් සූදනම් වූහ. ඒ වෙනුවෙන් කහවණු ලක්‍ෂයක් සම්මාදම් කළෝ ය. මේ නව තීර්ථකාරාමය ඉදිකිරීම වෙනුවෙන් ගෞතම බුදුන්වහන්සේගේ ශ්‍රාවක පිරිස විරුද්ධ වූහ. එම විරුද්ධත්වය වලකාලන්නට තීර්ථකයෝ එකී කහවණු අල්ලස් වශයෙන් රජුට දුන්හ. අනතුරුව දායකයන්ගේ ද්‍රව්‍ය සම්පාදනයෙන් තීර්ථකයෝ එහි ආරාමයක් සැකසීමට පටන් ගත්හ. මෙම පුවත සචචසංයුත්ත අටුවායෙහි දැක්වේ.[54] එක්තරා උපාසකයකු ථුල්ලනන්ද මෙහෙණට අවශ්‍ය දෑ ගැනීමට යම්කිසි වෙළඳසලක එක් කහවණුවක් තබා ගියේ ය. මෙයට අනුව ථුල්ලනන්දවෝ එක් ශිෂ්‍යමානවිකාවක යවා එකී කහවණුවට සරිලන සේ තලතෙල් ගෙනෙවයි යි කියා යැව්වා ය. මානවිකාව ද එහි ගොස් තලතෙල් ගෙනාවා ය. පසුව ථුල්ලනන්දවෝ තලතෙලින් වැඩක් නැතැයි පවසා ඒ වෙනුවට ගිතෙල් ගෙනව යි නැවත පිටත්කර හැරියා ය. මානවිකාව වෙළඳසල් හිමියාට ඒ බව පැවසීමේ දී අපි විකුණූ භාණ්ඩ නැවත නොගනිමුයි ද නැවත කවද ඒවා විකුණුමෝදැයි ඇසුවේ ය. (**විකකිත භණඩං පුන ආදියිසසාම කද අම්හාකං භණඩං පුන විකකයසංති**)[55]

මචුද්දන ජාතකයේ දැක්වෙන පරිදි එක්තරා කෙළෙඹි සොයුරන් දෙදෙනකු ගමකින් දහසක් උපදවා තම ගමට පැමිණියහ. අතරමගදී එක් සොයුරකු කහවණු මල්ල සොරාගනු පිණිස ඒ වෙනුවට බොරළු මල්ලක් තැබීය.[56] කණ්හජාතකයේ කහවණු ඉපයීමක් මෙසේ දැක්වෙයි. ගැල් පන්සියයක් සහිත සාත්තු නායකයකු ගැඹුරු වූ විෂම වූ තොටකට වැටුනේ ය. එයින් ගොඩ ඒමට අසමත් ව සිටි කල්හි ශක්තිමත් වෘෂභයකු (බෝසත් තුමා) මාර්ගයෙන් එක් ගැලකට කහවණු දෙක බැගින් කහවණු දහසක් ගෙවා ගොඩ ආවෝ ය.[57] රාජ සේවයට ගිය එක්තරා බමුණකු රජුගේ වන්නකුතැනට නොදන්වා කහවණුවක් දෙකක් වශයෙන් ගෙන තෙවන දිනයේ දී කහවණු මිටක් රැගෙන ගියේ ය.[58] අලීන චිත්ත ජාතකයේ දැක්වෙන පරිදි දර වෙළඳම මෙසේ



ය. එකළ පන්සියයක් දර වඩුවෝ ඉහළ නදී තිරයේ සිට දර ගෙනමින් නගරයේ ගෘහ කර්මාන්ත කොට කහවණු උපයා ගත්හ.[59] නිමි ජාතකයේ මඛාදේව රජු දින පතා පස්සිය දහසක් වියදම්කොට දන් දුන්නේ ය.[60] මාතංග ජාතකයේ එන පරිදි ඇස් පනාපිට දිට්ඨමංගලිකාවන් දකින කැමැත්තෝ කහවණුව බැගින් දුන්හ.[61] ඒ අනුව ඇයට දහඅට කෝටියක් ලැබිණ. නිග්‍රොධ ජාතකයට අනුව ශිෂ්‍යයන් විසින් ගුරුවරයාට කහවණු දහස් ගණනින් පුදනු ලැබූහ.[62] සූනඛජාතකයට අනුව එක්තරා මිනිසකු උතුරු සලුවක් සහ කහවණුවක් ද දී සූනඛයකු රැගෙනගොස් තිබේ.[63] මහාඋම්මගග ජාතකයේ සඳහන් පරිදි වඩුතැනට දීම් සඳහා කුමාරවරු විසින් කහවණු එක බැගින් ගෙනෙන ලද්දාහුය.[64] සත්තුභත්ත ජාතකයේ එක්තරා බ්‍රාහ්මණයකු චාරිකාවේ හැසිර කහවණු දහසක් උපයාගත් බව සඳහන් වේ. (**ධනං භිකඛං චරිතවා කහාපණ සහසසං ලභිතවා**)[65]. මග සිටියොත් තෝ නසී ගෙදර ගියොත් අඹු නසී යන්න සඳහන්වන්නේ මෙම ජාතකයේ ය.[66] සීලවිමංස ජාතකයේ බෝසත්තුමා බ්‍රාහ්මණව ඉපිද සීලය වැඩිදේහෝයි ජාතිය වැඩිදේහෝයි විමසනු පිණිස වීථියේ පිලින් රන්ඵල හා කහවණු සොරකම්කළ සිද්ධියක් වාර්තාවෙයි.[67] බබ්බු ජාතකයේ කහවණු සම්බන්ධයෙන් මෙසේ දැක්වෙයි. "එකල සතලිස් කෙළක් ධනය නිධන්කළ සිටුවරයකු මියගිය පසු ඒ විස්තර දත් ඔහුගේ බිරිඳ ද කලෙක මියගොස් ධනාශාවෙන් ධනය නිධන්කළ බිමෙහි මී දෙනකව උපන්නා ය. බෝසතුන් එ කල්හි ගල්පලන කර්මාන්තයෙන් ජීවිකාව කළේ ය. බෝසතුන් කෙරෙහි පැහැදුණු එකී මී දෙන දිනක් කහවණුවක් කටින් ගෙන බෝසතුන් ඉදිරියේ දමාපියා ගියා ය. එම කහවණුව සඳහා මස් ගෙනවිත් දෙමින් එකී සතලිස් දහසක් වටිනා වස්තුව (කහවණු) බෝසත්තුමා අත්පත් කර ගත්හ.[68]

බරණැස් නුවර කාලි නම් ගණිකාව දිනකට කහවණු දහසක් ලැබුවාය.[69] එ සමයෙහි රජගහනුවර සාලවතී වෙත යන්නවුන් රැයකට කහවණු සියයක් රැගෙන යති.[70] අම්බපාලි ගණිකාව වෙත යන්නවුන් රැයකට කහවණු පනසක් රැගෙන යති.[71] අම්බපාලි ගණිකාව බුදුපාමොක් සඟනට දනට ආරාධනා කොට එය සැකසීමට යුහුසුලුව ගමන් ගත්තීය. මේ අතරතුර හමුවූ ලිච්ඡවීන් මේ දැක ඇයගෙන් බුදුන් ප්‍රමුඛ භික්‍ෂූන්ට දන්දීමට එම දිනය ඉල්ලූහ. එයට කහවණු ලක්‍ෂයක්දීමට ද හැකි බව කියා සිටියහ. එහෙත් ඇය එම දානවේල

ලිච්ඡවීන් සඳහා වෙන් නො කළාය.[72] වෙස්සන්තර ජාතකයේ එන පරිදි පූජක බමුණකුට සිඟමින් ගොස් කහවණු සියයක් ලැබීය.[73]

පෙර දවසක ගම්මුදලියකු කහවණුයෙන් දඩගත් ආකාරය මෙසේ දැක්වේ. "මම මේ මිනිසුන් රා බොන කල්හි ත් සතුන් මරණ කල්හි ත් රා සැළකට කහවණුවක් දඩ ගනිමියි" යන්න කුලාවක ජාතකයේ සඳහන් වේ.[74] බුදුන්වහන්සේ දවස සිරිමා ගණිකාව දිනපතා කහවණු දොළොසක් අගයට සරිලන සේ භික්ෂූන්ට දන් දුන්නාය. සිරිමාව මියගිය පසු දින සතරකට අනතුරුව ඇයගේ සිරුර බැලීමට සුසානයට සියලු නගරවැසියෝ පැමිණිය යුතු බවත් නො එන අයෙකුගෙන් කහවණු අටක් දඩ ගන්නේයැයි ද රජු නිවේදනය කළේය. බුදුන්වහන්සේගේ අවවාද අනුව සිරිමාවගේ සිරුර දහසකට ගනු කැමැත්තෝ එත්වයි අඬබෙර ලැවීය. කිසිවෙකු හෝ පැමිණියේ නැත. මෙය කහවණු 500, 300, 200, 100, 50, 25, 20, 10, 5, 1 දක්වා ද කහවණුවෙන් 1/2ක් 1/4ක් දක්වා අඩු කළ ද කිසිවෙකු හෝ ඉදිරිපත් නොවී ය.[75] ඉහත පුවතට අනුව කහවණුව කොටස්වලට බෙදී ඇති අයුරු **අඩ්ඪ පාද, මාෂක, කාකණිකං** යන වදන්වලින් පැහැදිලි වෙයි. ගංගාමාල ජාතකයේ ද **මාෂක, අඩ්ඪමාෂක,** කහවණු ආදිය සඳහන් වෙයි.[76] උයද ජාතකයේ සඳහන් පරිදි **ස්වණණ මාෂක** සහ කහවණු පිරවූ පාත්‍ර දක්නා ලැබේ.[77] තුණ්ඩිල ජාතකයේ ද එක්තරා කාරණයක් සම්බන්ධයෙන් කහවණු භාවිතව ඇත.[78]

ඒ කල නයි නැටවූ එක්තරා බ්‍රාහ්මණයකු දිනකට කහවණු දහසක් හා පිරිකර ලැබී ය.[79] එක්තරා පුද්ගලයකුගෙන් ලබාගත් අඹ ඵල කා සතුටු වූ රජෙකු ඒ අඹ කොයින්දැයි විචාරා ඒවා ගෙනදෙන ලෙස එම පුද්ගලයාට කහවණු දහසක් දුන්නේ ය. ඒ කහවණු දහස තම අඹුදරුවන්ට දී ඔහු අඹගෙන ඒමට ගිය පුවතක් පේතවත්ථු අට්ඨකථාවේ සඳහන් වෙයි.[80] කහවණු සහ මාෂක වැසි පිළිබඳව සරභංග ජාතකයේ සඳහන් වෙයි.[81] කුණාල හා මහාසුතසෝම ජාතකයේ ද කහවණු පිළිබඳ විස්තර සඳහන් වෙයි.[82]

කහවණුවලට මුවන් විකුණූ පුවතක් මෙසේ ය. එක්තරා මුව වැද්දෙක් මුවකු හා මුව පැටියකු රැගෙන යන අතර දී තවත් අයෙක් මිල කීය දැ යි ඇසී ය. එහි දී මුවා කහවණු දෙකකි. මුව පෝතකයා එක් කහවණුවකි යයි වැද්ද පිළිතුරු දුන්නේ ය. එවිට එක් කහවණුවක් දී එකී පුද්ගලයා මුව පෝතකයා රැගෙන ගියේ ය. මඳ දුරක් ගොස් ආපසු පැමිණි ඔහු මුව පෝතකයාගෙන් වැඩක් නැත මුවා



දෙව යි කිය. එවිට කහවණු දෙකක් දෙවයි වැද්ද කීවේ ය. මිල දී ගත් නැනැත්තා මෙසේ කීවේ ය. මම මුලින් කහවණුවක් දුනිමි. එය සැබවියයි වැද්ද කීවේ ය. එසේනම් මේ මුව පෝතකයා ද ගනුව ඔහු ද කහවණුවක් වටී. තව ද කහවණුවක් මේ පෝතකයා සමඟ ගනුව එවිට කහවණු දෙකක් වටනේ ය. එසේ ගෙන මුවා දෙව යි කීය. වැද්ද කාරණය වටහාගෙන මුව පෝතකයා සහ තව කහවණුවක් ලබාගෙන මුවා දුන්නේ ය.[83]

කොසොල් රජු එසමයෙ හි තම එක් පුත්‍රයකු කැඳවා මෙසේ කීවේ ය. තෙපි භාග්‍යවතුන්වහන්සේ සමීපයට ගොස් ගාථා ඉගෙනවිත් මම බත් වළඳන කල්හි කියව. මම තොපට දිනපතා කහවණු සියයක වැටුප් ගෙවමි.[84] මරණීය දණ්ඩනයට ලක් වූ සොරදෙටුවකු බේරා ගැනීමට එක්තරා සිටු දියණියක විසින් අල්ලස් ලෙස කහවණු දෙන ලදි.[85]

පාලි මුත්තක විනය විනිච්ඡයට අනුව ස්පර්ශ නොකළ පිණ්ඩපාතය (අනාමට්ඨ පිණ්ඩපාතො) දෙමාපියන්ට දියහැකි බවත් එය කහවණුවක් අගනා බවත් දැක්වේ.[8] [6]කිසියම් භික්ෂුවක් කුඹල් ගමට ගොස් කහවණුවක් දී මට, අසුවල් පාත්‍රය දෙවයි කියා ගන්නේ නම් අකැප වෙයි[87] කහවණු උපමා කරගනිමින් එක්තරා දඬුවමක් එකල සිදුකළ බව මහා නිද්දේස පාලියේ එයි. එනම්, <u>කහාපණකම්පි කරොන්ති</u> - කහාපණික කම්කටොලු ද කෙරෙති. මෙය තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර නිර්දේශයේ දැක්වෙන්නකි. අපරාධකරුවන්ට රජවරු විසින් දෙනු ලබන දඬුවමකි. සිරුර කැබලිවලට කැපීමකි.[88] සද්ධම්මපජෝතිකාවේ තව ද එය මෙසේ විස්තර වෙයි. <u>කහාපණකන්ති සකල ශරීරං තිණ්හාහි වාසීහි කොට්ටෙත්වා පට්ඨාය කහාපණ මත්තං පාතෙන්තො කොට්ටෙන්ති</u> **(තියුණු වෑයකින් හෝ පිහියකින් මුදුනේ සිට කහවණුවක් පමණ වනතෙක් කොටති)**[89] මෙම උපමාව තව ද අට්ඨකථා තුළ දක්නා ලැබේ.[90]

කහවණු සම්බන්ධයෙන් ලංකාවේ ද පාලි සාහිත්‍යය හා වෙනත් මූලාශ්‍රවල තොරතුරු බහුලව දක්නා ලැබේ. ඉන් නිදසුන් කීපයක් මෙසේය. ලක්දිව මහාගාමයෙහි (මාගම) දැව භාණ්ඩ වෙළඳම් කළ තිස්ස නැමැත්තා දිළිඳුබවට පැමිණියේ ය. අනතුරුව ඔහු දුරපලාතක උක් අඹරණ යන්ත්‍රාලයක සේවය කොට සයමසකින් කහවණු දොළොසක් ලබා ගත්තේ ය. මෙම කහවණු දොළොසින් එවකට දස භාවයට පත් කොට සිටි ඔහුගේ දියණියක ඉන් මුදවා



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
0 2 OCT 2015

ගන්නට උත්සාහ කළේය.[91] දිගු විස්තරයක් එහි සඳහන් වේ. කාවන්තිස්ස රජු දවස රෝහණ ජනපදයේ නකුල නම් උපාසක තැන ඔහුගේ දියණියක කහවණු දොළොසකට තවත් ගෘහයකට පැවරුවේ ය.[92] කහවණු සැටකට දසියක වූ කතක් දන්දීම සඳහා කහවණු අවශ්‍ය වී නැවත කහවණු සැටක් සොයා යන විටක දී තවත් තැනකින් කහවණු සැටක් ණයට ගත්තා ය. ඇයට එය ලියවිල්ලකින් දුන් පුවතක් ද එහි වේ. ඇය එක් එක් නිවසකට කහවණුව බැගින් දී දන් සකසා භික්ෂූන්ට ඒවා ලබන්නට ආරාධනා කළා ය.[93] සද්ධාතිස්ස රජු සමයේ දී සද්ධාතිස්ස නමින් ඇමතියෙක්විය. ඔහු අනුරපුර ගොස් රජුට සේවය කොට ආපසු ගමට එන අතර පිඩුපිණිස හැසිරෙන භික්ෂුවක් දැක බත් සමගින් යන මගියකුගෙන් කහවණු අටක් දී බත්ගෙන භික්ෂුවට පිදී ය.[94]

## කහවනුවේ අර්ථකතන .

**කහවණුව** යන්න අභිධානප්පදීපිකාවේ දක්වා ඇත්තේ කහපණො, කරිසාපණො ලෙසිනි.[95] කහාපණවසස = මුදල් වර්ෂාව, කහාපණගබ්භ = මුදල් තබන සේප්පුව ආදී වශයෙන් කෝෂග්‍රන්ථයක කහවණුව විස්තර වෙයි.[96] කහවණු නම් රත්රන් මදටිය විස්සක පමණ බර ඇති පැරණි කාසියකි.[97] කහවණු යන්න සංස්කෘත කෝෂ ග්‍රන්ථයක <u>කර්ෂාපණ</u> යනුවෙන් සඳහන් වේ.[98] තවත් ග්‍රන්ථයක කහවණුව මෙසේ විස්තර වෙයි. කර්ෂ= මාෂක සොලොසක් බර, තුන් කළඳ, බුලුගස, තුන්කළඳක් බර ඇති රත් කර්ෂාවල = බුලු ගස, කර්ථඵලා = නෙල්ලි ගස,

කර්ෂාපණ = කහවණුව යනුයි.[99] සිංහල සම්භාව්‍ය සාහිත්‍යයේ තැනක කහවණු යන්න <u>කහවුන්</u> ලෙසින් දැක්වෙයි.[100] සිංහල දෙමළ අකාරාදියේ කහවණුව = පොට්කාසු ලෙස සඳහන් වේ. එනම් රත්රන් කාසිය යනුයි.[101] විසුද්ධිමග්ගයේ ඛන්දක නිද්දේශයේ එක්තරා පාඨයකින් කහවණු පිළිබඳව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් වෙයි. එනම්, කහවණුව රවුම්, හතරැස් යනාදී විසිතුරු හැඩවලින් යුක්ත බවයි. ඒවාට ස්වර්ණ යන නාමය යොදන බවත් දැක්වේ. එසේ ම ඒවා විවිධ ලෝහවලින් ද යුක්තවේ යනුයි.[102] පුරාවිද්‍යා මූලාශ්‍ර අනුව භාරතයේ බුද්ධකාලීන සමාජයේ සිට සහ ලංකාවේ පුරාණ සමාජයේ භාවිතවූයේ යයි පිළිගැනෙන ලෝහ කාසි රැසක් හඳුනාගෙන තිබේ. ඒවායේ මුල්ම කාසි කහාපණ හෝ කහවණු වශයෙන් ප්‍රකාශිතව ඇත. විවිධ සලකුණු ඇති



කාසි මෙන් ම සලකුණු රහිත වශයෙන් ද මේවා දෙයාකාර වේ. වඩාත් පුරාණ ඒවා සලකුණු රහිත ඒවා බවට විශ්වාස කරයි. පොදුවේ බලන විට සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් කහවණු භාරතය සහ ලංකාව යන දෙතැනින් ම වාර්තාවීම දක්නා ලැබේ. පැරණි සමයේ වාණිජ තොරතුරු, මුදල්, වාණිජ භාන්ඩ ආදියත් ඒ ආශ්‍රිත තවද තොරතුරු සඳහා අට්ඨකථා මූලාශ්‍ර ප්‍රයෝජනවත් වන බව පැහැදිලි වේ.

## අන්තික සටහන්.

1 මලලසේකර, ගුණපාල.. ලංකා පාලි සාහිත්‍යය. 1965, ගුණසේන, කොළඹ සංඥපනය පි. 1

2 අදිකාරම් ඊ.ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, 2003, එස්. ගොඩගේ, කොළඹ, දෙවන මුද්‍රණය, පි. 21.

3 චන්දරතන, ලබුහේන්ගොඩ, පාලි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන, 2006, දෙවන මුද්‍රණය, කොළඹ, පි. 20-21.

4 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ 2007, රත්න පොත්, සිවුවන මුද්‍රණය, පි. 142.

5 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු, 1926, පි.93.

6 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු., 1926, පි.103-104.

7 .............................. හේ.මු, 1926, පි.100.

8 ................................ හේ.මු, 1926, පි.114-115.

9 .............................. දුතියොභාගො, හේ.මු. 1928, පි.22.

10 ................................ පඨමොභාගො, හේ.මු, 1926, පි.320.

11 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු, 1926, පි.348.

12 .......... දුතියොභාගො, 1928, පි.129-133.

13 චූල්ලනිද්දේසට්ඨකථා, හේ.මු. 1923, පි.44.

14 සංයුක්තනිකායට්ඨකථා, පඨමොභාගෝ, හේ.මු. 1921, පි.240.

15 විමානවත්ථු අට්ඨකථා, හේ.මු. 1925, පි.217.

16 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.179.

17 ධම්මපදට්ඨකථා, හේ.මු. 1919, පි.33.

18 ධම්මපදට්ඨකථා 1, හේ.මු. 1919, පි.353.

19 සංයුත්තනිකායට්ඨකථා, පඨමොභාගො, හේ.මු, කොළඹ, 1924, පි. 43.

20 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු, 1926, පි.348.

21 .......... දුතියොභාගො, 1928, පි.129-133.

22 චූල්ලනිද්දේසට්ඨකථා, හේ.මු. 1923, පි.44.

23 සංයුක්තනිකායට්ඨකථා, පඨමොභාගෝ, හේ.මු. 1921, පි.240.

24 විමානවත්ථු අට්ඨකථා, හේ.මු. 1925, පි.217.

25 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.179.

26 ධම්මපදට්ඨකථා, හේ.මු. 1919, පි.33.

27 ධම්මපදට්ඨකථා 1, හේ.මු. 1919, පි.353.

28 සංයුත්තනිකායට්ඨකථා, පඨමොභාගො, හේ.මු, කොළඹ, 1924, පි. 43.

29 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු, 1926, පි.348.

30 ............ දුතියොභාගො, 1928, පි.129-133.

31 චූල්ලනිද්දේසට්ඨකථා, හේ.මු. 1923, පි.44.

32 සංයුක්තනිකායට්ඨකථා, පඨමොභාගෝ, හේ.මු. 1921, පි.240.

33 විමානවත්ථු අට්ඨකථා, හේ.මු. 1925, පි.217.

34 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.179.

35 ධම්මපදට්ඨකථා, හේ.මු. 1919, පි.33.

36 ධම්මපදට්ඨකථා 1, හේ.මු. 1919, පි.353.

37 සංයුත්තනිකායට්ඨකථා, පඨමොභාගො, හේ.මු, කොළඹ, 1924, පි. 43.

38 ජාතකට්ඨකථා, පඨමොභාගො, හේ.මු, 1926, පි.217.

39 ........... දුතියො භාගො, 1928, පි.22.

40 ධම්මපදට්ඨකථා, හේ.මු. 1919, පි.40.

41 විවාහවත්ථු අට්ඨකථා, හේ.මු. 1925, පි.126.

42 මජ්ඣිමනිකායට්ඨකථා, හේ.මු. 1933, පි.298.

43 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.36.

44 චූලනිද්දේසට්ඨකථා, හේ.මු. 1923, පි.44.

45 පඤ්චප්පකරණට්ඨකථා, හේ.මු. 1939, පි.69.

46 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.154.

47 මාතිකට්ඨකථා, හේ.මු. 1930, පි.71.

48 චූල්ලවග්ග පාලි (2) බු.ජ.ග්‍ර.5 (2), පි.566-567.

49 විමාණවත්ථුප්‍රකරණය, බු.ජ.ග්‍ර 26, පි.36.

50 පාරාජික පාලි, බු.ජ.ග්‍ර 1, පි.550-551.

51 එම.

52 එම.

53 මනෝරථපූරනි හෙවත් අංගුත්තරනිකායට්ඨකථා පඨමොභාගො, හේ.මු, 1993 (නැවත මුද්‍රණය) පි.293.

54 පාලි සාහිත්‍ය / පොල්වත්තේ බුද්ධදත්ත හිමි, අම්බලන්ගොඩ, 1956, පි.194-195.

55 පාචිත්‍යය පාලි, බු.ජ.ග්‍ර. 2(2), පි.106.

56 ජාතකට්ඨකථා දුතියොභාගො, හේ.මු. 1928, පි.297.

57 පඨමොභාගො, හේ.මු. 1928, පි.171.



58 පඨමොභාගො, හේ.මු. 1928, පි.313.

59 දුතියොභාගො, හේ.මු. 1928, පි.14.

60 සප්තමොභාගො, හේ.මු. 1939, පි.81-91.

61 පඤ්චමොභාගො, හේ.මු. 1935, පි.75-85.

62 චතුත්ථොභාගො, හේ.මු. 1934, පි.71-75.

63 දුතියොභාගො, හේ.මු. 1928, පි.71.

64 සත්තමොභාගො, හේ.මු. 1939, පි.298-329.

65 තතියොභාගො, හේ.මු. 1931, පි.239-246.

66 තතියොභාගො, හේ.මු. 1931, පි.239-246.

67 පඨමොභාගො, හේ.මු. 1928, පි.301-302.

68 පඨමොභාගො, හේ.මු. 1928, පි.401-403.

69 ජාතකට්ඨකථා චතුත්ථොභාගො, හේ.මු. 1934, පි.227.

70 මහාවග්ග පාලි (11), බු.ජ.ග්‍ර, පි.675.

71 පාලි (11), බු.ජ.ග්‍ර. පි.673.

72 දීඝනිකාය (11), බු.ජ.ග්‍ර,V111, පි.153.

73 ජාතකට්ඨකථා සත්තමොභාගො, හේ.මු. 1939, පි.458.

74 පඨමොභාගො, හේ.මු. 1928, පි.175.

75 විමානවත්ථු අට්ඨකථා, හේ.මු. 1925, පි.60-62.

76 ජාතකට්ඨකථා තතියොභාගො, හේ.මු. 1931, පි.315-319.

77 චතුත්ථොභාගො, හේ.මු. 1934, පි.121-128.

78 තතියොභාගො, හේ.මු. 1931, පි.201

79 චරියාපිටකට්ඨකථා, හේ.මු. 1929, පි.103.

80 පේතවත්ථු අට්ඨකථා, හේ.මු. 1917, පි.111.

81 ජාතකට්ඨකථා ඡට්ඨමොභාගො, හේ.මු. 1937, පි.23.

82 ඡට්ඨමොභාගො, හේ.මු. 1937, පි.246 හා 290.

83 පඤ්චප්පකරණට්ඨකථා, හේ.මු. 1939, පි.69.

84 සංයුක්තනිකාය, බු.ජ.ග්‍ර.13, පි.152.

85 ධම්මපදට්ඨකථා පඨමොභාගො, හේ.මු. 1919, පි.87.

86 පාලි මුත්තක විනය විනිච්ඡයසංගහො, සංස්.වේරගොඩ අමරමෝලි හිමි,(19..?), (ප්‍රකාශක නැත, ස්ථානය නැත) පි.13.

87 පි.54.

88 මහානිද්දේස පාලි, බු.ජ.නි.ග්‍ර.33, 1961, පි.212-213.

89 මහානිද්දේසට්ඨකථා, හේ.මු. 1921, පි.197.

90 සුත්තනිපාතට්ඨකථා, හේ.මු. 1920 පි.77 සහ අංගුත්තරනිකායට්ඨකථා 1, හේ.මු. 1923 පි.293.

91 මනොරථපූරනි නාම, අංගුත්තරනිකායට්ඨකථා, පඨමොභාගො, හේ.මු. 1923, පි.277-279.

92 රසවාහිනී, ගුණසේන,1961, කොළඹ, පි.247.

93 පි.122.

94 පි.113.

95 අභිධානප්පදීපිකා, මොරගොල්ලේ සිරි ඤාණෝභාසතිස්ස ස්ථවිර, 1960, ගුණසේන, කොළඹ, පි.104.

96 පාලි-සිංහල ශබ්දකොෂය-මඩිතියවෙල සිරි සුමංගල ස්ථවිර, 1965, ගුණසේන, කොළඹ, පි.230.

97 ධම්මපද විවරණය-මොරගොල්ලේ ඤාණෝභාසතිස්ස ස්ථවිර, 1992, ගුණසේන, කොළඹ, (නැවත මුද්‍රණය), පි.389.

98 ප්‍රාකෘත, කෝදගාඩ ඤාණාලෝක හිමි, 1939, ප්‍රාචීන භාෂෝපකාර පොත් සමාගම, කොළඹ, පි.19.

99 සංස්කෘත ශබ්දර්තවය, වැලිපිටියේ සොරත හිමි, 1999, ගොඩගේ, කොළඹ, (දෙවන මුද්‍රණය) පි.178-179.

100 අමාවතුර-කෝදගොඩ ඤාණාලෝක ස්ථවිර, 1998, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි.65.

101 ඇට්ලස් හෝල්, සිංහල දෙමළ අකාරාදිය, 1964, ඇට්ලස් හෝල්, කොළඹ, පි.106.

102 ශ්‍රී ලංකාවේ පුරාණ කාසි, කල්දේරා ලීලානන්ද, ශ්‍රී ලංකාවේ මිල මුදල්, 2010, ජාතික කෞතුකාගාරය, කොළඹ (නැවත මුද්‍රණය), පි.6-7.